
## දෙවන පියවර

රුධිරයේ සීරම් ක්‍රියටිනින් (serum creatinine) සහ e GFR නම් පරීක්ෂණයක් කිරීමෙන් වකුගඩු පරීක්ෂා කල හැක.





## දියවැඩියාවෙන් වකුගඩු ආරක්ෂා කර ගන්නේ කෙසේද?

www.srilankadiabetesfederation.lk

- රුධිර සීනි මට්ටම හොදින් පාලනය කර ගැනීමෙන්
- අධි රුධිර පීඩනය හොදින් පාලනය කර ගැනීමෙන්
- වසරකට එක් වරක්වත් ඉහත සඳහන් රුධිර හා මුත්‍ර පරීක්ෂණ කර ගැනීමෙන්
- වෛද්‍ය උපදෙස් මත වකුගඩු රෝගය සඳහා අදාළ ඖෂධ නිසි පරිදි ලබා ගැනීමෙන්

# දියවැඩියාවෙන් ඔබේ වකුගඩු ආරක්ෂා කර ගනිමු.




SRI LANKA DIABETES FEDERATION

SLDC Sri lanka Diabetes & Cardiovascular Disease Initiative

SLCE Sri Lanka College of Endocrinologists

WORLD DIABETES FOUNDATION

## දියවැඩියාවෙන් ඔබේ වකුගඩු වලට වන හානි වනවාද?





ඔව්. දියවැඩියාවෙන් ඔබේ වකුගඩු හානි වී සම්පූර්ණයෙන් අක්‍රීය තත්වයට වුවද පත් විය හැක. එවිට වකුගඩු බද්ධ කිරීමට හෝ නිරතුරුව කාන්දුපෙරණයට (ඩයලසිස් ) යොමු වීමට සිදු වේ.



www.srilankadiabetesfederation.lk

## දියවැඩියාව ඇති සියලු දෙනාට වකුගඩු රෝගය වැළදේද?

කිසිසේත් නැත. දියවැඩියාව ඇති රෝගීන්ගෙන් බහුතරයකට (60% - 80%) කට වකුගඩු රෝගය වැළදෙන්නේ නැත. නිසි පරිදි ප්‍රතිකාර ගැනීමෙන් සහ වෛද්‍ය උපදෙස් පිළිපැදීමෙන් පහසුවෙන් වකුගඩු රෝගයෙන් ආරක්ෂා වීමට ඔබට හැක.



## දියවැඩියාවට ලබා ගන්නා ඖෂධ වලින් වකුගඩු වලට හානි වන්නේද?

නැත. මෙය සම්පූර්ණයෙන්ම මිත්‍යා මතයකි. දියවැඩියාවට සුදුසුකම් ලත් වෛද්‍යවරයකු විසින් ලබා දෙන ඖෂධ වලින් වකුගඩු වලට හානි සිදු නොවේ. බොහෝ ඖෂධ වලින් වකුගඩු වලට අමතර ආරක්ෂාවක් ලබා දෙයි.
විශේෂයෙන් මෙට්ෆොර්මින් ඖෂධයෙන් වකුගඩු වලට කිසිදු හානියක් නොවේ. නමුත් දියවැඩියාවෙන් හානි වූ වකුගඩු ඇති රෝගියෙකුට සාමාන්‍යයෙන් මෙම ඖෂදය නිර්දේශ නොකෙරේ.




## දියවැඩියාවෙන් වකුගඩු වලට හානි වී ඇත් දැයි පරීක්ෂා කර ගන්නේ කෙසේද?

මේ සඳහා නිසි පරිදි වෛද්‍ය උපදෙස් ලබා ගැනීම අත්‍යවශ්‍ය වේ.

### පළමු පියවර

මුත්‍රා වල පිට වන ඇල්බියුමින් නම් ප්‍රෝටීනය පරීක්ෂා කර බැලීම මගින් වකුගඩු වලට හානියක් වී ඇත් දැයි පරීක්ෂා කරගත හැක.

